

මෙබඳු ගොවියන්ට වගා කාලසටහනක ප්‍රයෝජනය ඉමහත්ය.

# කෘෂිකාර්මයේ දියුණුවට වගා කාලසටහනක්

කෘෂිකාර්මික දියුණුව යනු හුදෙක් භෞතික නිෂ්පාදනයේ වැඩිවීමක් පමණක් යැයි සිතිය යුතු නොවේ. නිෂ්පාදනයේ වැඩිවීමත් සමග ගොවි මහතුන්ගේ ජීවන මට්ටමේ උන්නතියත්, ආදායම් බෙදී යාමේ දියුණුවත් ඈඳිය ද කෘෂි සංවර්ධනයට අදාල කරුණු ලෙස සැලකිය යුතුය. කෘෂිකාර්මික දියුණුවේ ප්‍රතිඵල රඳා පවතිනුයේ ගොවීන්ගේ අන්‍යෝන්‍ය සහයෝගිත්වය, සමාජීය හා සංස්කෘතික කරුණු වටහා ගැනීමේ ශක්තිය හා ඔවුන්ගේ වගකීම් ගැන ඇති සැලකිල්ල මතයි.

කෙසේ වුවද මෙම ලිපියේ අප අදහස් කරනුයේ වගාවේදී අතිශයින්ම වැදගත්වන තාක්ෂණික කරුණක් පිළිබඳව අදහස් දැක්වීමයි. නිවැරදි යෙදවුම්, නියමිත වේලාවට නියමාකාරයෙන් යෙදවීමට හා ප්‍රයෝජනයට ගැනීමට ගොවීන් පුරුදු පුහුණුවීම කෘෂිකාර්මික දියුණුව සඳහා පූර්ව අවශ්‍යතාවයක් ලෙස පිළිගෙන ඇත. මෙහිදී අප ප්‍රධාන වශයෙන් සලකා බලනුයේ වාරිමාර්ග පද්ධතීන් යටතේ කෙරෙන වී ගොවිතැන ගැනයි.

කන්න රැස්වීම්වලදී ගොවීන් සහ නිලධාරීන් විසින් සාකච්ඡා මාර්ගයෙන් යොදා ගන්නා වගා කාලසටහන අනුව ගොවිතැන් කිරීම ඉතාමත් වැදගත්ය. මෙයට ප්‍රධානම හේතුව වනුයේ නියමිත යාය හෝ යායවල් කිහිපයක් සඳහා සකස් කරන ලද වගා කාලසටහනට පිටස්තරව වගා කිරීමෙන්, තමාට පමණක් නොව මුළු යායේ අනික් ගොවීන්ට ද ප්‍රශ්න රැසකට මුහුණ පෑමට සිදුවීමයි.

වගා කාලසටහන සම්පාදනය කෙරෙන්නේ ප්‍රතිපත්ති, ක්‍රියාමාර්ග හා සහභාගීත්වය තේමාකොට ගත් පොදු සම්මුතියක් වශයෙනි.

වාරි ජලයෙන් වගා කරන කුඹුරු යායක් සඳහා කන්න රැස්වීමේදී පිළියෙල කරගත් වගා කාල සටහනක සාමාන්‍යයෙන් අඩංගු වන කරුණු ගැන සෑම ගොවියෙකුටම හොඳ වැටහීමක් තිබිය හැක. නමුත් අපි මෙහිදී එහි අඩංගු කරුණු ගැන මතක් කරදීමක් කරමු.

පර්යේෂණ හා පුහුණුකිරීමේ නිලධාරී

## තිස්ස යටවර

**විසිනි**

සාමාන්‍යයෙන් වගා කාලසටහනක ඇලවේලි ශුද්ධ කිරීමේ අවසාන දිනයත්, මුලින්ම එම යායට ජලය නිකුත් කරන දිනයත් මේ අනුව බිම් සකස් කිරීමේ අවසාන දිනයත් නියම කර ඇත. මීට අමතරව වී වැපිරීමේ හෝ පැල සිටුවීමේ අවසාන දිනයද අවසාන වරට යායට ජලය නිකුත් කරන දිනයද, ජලය බෙදහැරීම අත්හිටුවන දින ද නියම කර ඇත. වී අස්වැන්න එකතු කළයුතු අවසාන දිනයත් ඒ අනුව යායට ගවයන් මුදහැරීමට දිනයත් වගා කාල සටහනෙහි සඳහන්ව ඇත. සමහර වගා කාලසටහන් වල කෘමිනාශක හා වල්නාශක යොදන දිනත් පොහොර යොදන දිනත් සඳහන්ව ඇත.

ඇත්තෙන්ම වගා කාලසටහනට පටහැනිව ක්‍රියා කිරීමෙන් කුඹුරෙහි අස්වැන්න අඩුවෙනවා පමණක් නොව ජලය විශාල වශයෙන් අපතේ යෑමක් ද සිදුවේ.

වගා කාලසටහනට අනුව ක්‍රියාකිරීමේදී ඉතාමත්ම වැදගත් ආගය වනුයේ නියමිත දිනට බිම් සකස් කිරීම, වැපිරීම හෝ පැල සිටුවීම හා අස්වැන්න එකතුකිරීම වැනි කාර්යයන් කිරීමයි. අනික් කාර්යයන් ගැන සැලකිල්ලක් දැක්වීම ද වැදගත් ය. මෙම කාර්යයන් නිසි වේලාවට කිරීමට නොහැකිවීමට යම් යම් හේතු තිබිය හැක. යම් විටක බිම් සකස්කිරීම හා අනෙකුත් කාර්යයන්, ජල ගැලීම්, නියඟය වැනි ස්වභාවික විපත් නිසා අතපසු විය හැක. මෙයට අමතරව නිසි වේලාවට අවශ්‍ය කම්කරු ශ්‍රමය, ගවයන් හා ට්‍රැක්ටර් වැනි යන්ත්‍රෝපකරණ ලබා ගැනීමට නොහැකිවීම නිසාද, ගොවීන්ගේ මුදල් අගහිඟකම් නිසාද නියමිත දිනයන්වලට ඒ ඒ කාර්යයන් කිරීම අතපසු විය හැක. දීර්ඝකාලීන වී වර්ගයන් වගාව සඳහා යොදගැනීම නිසා අස්වැන්න නියමිත දිනට නෙලා ගැනීම පමාවේ. මේ නිසා සෑම ගොවියෙක්ම එක හා සමාන වී වර්ගයන් භාවිතා කිරීම අවශ්‍ය කරුණකි. වාරිමාර්ග පද්ධතියේ යම් හදිසි අලුත්වැඩියාවන් නිසා ජලය නිකුත් කිරීම ප්‍රමාද විය හැක. මේ නිසාද වගා කටයුතු ප්‍රමාද වේ.

සමහර අවස්ථාවලදී වගා කාලසටහන අනුව ක්‍රියා නොකිරීමෙන් වාසි ඇති බව කෙනෙකුට තර්ක කළ හැක. ඇත්ත වශයෙන්ම එවැනි වාසි නැතිවාම නොවේ. අපි එම කරුණු ගැනත් සුළු වශයෙන් හෝ සලකා බලමු.

නියමිත දිනයන්ට වගා නොකිරීමෙන් ස්වභාවික විපත්වලින් සිදුවන හානි අඩු කරගත හැක. එයට උදහරණයක් නම් ජල ගැල්මකදී වයස්ගත උස් වූ ගොයමට වඩා ලාබාල, වඩා උස් නොවූ ගොයමට හානි පැමිණේ. මෙයට අමතරව මුළු කන්නය පුරා අස්වැන්න නෙලීමෙන් කන්නය පුරා වී වෙළඳපලට පැමිණේ. මේ නිසා සාමාන්‍යයෙන් වී අස්වැන්න නෙලන කාලයට පෙර වී මිලෙහි නැගීම ද එතරම් විශාල ලෙස සිදු නොවේ. තවත් කරුණක් නම් ගබඩා කිරීමේදී ඇතිවන තදබදයද අඩුවේ. ගොවීන් සියල්ලම එකවිට වගා කටයුතුවල නොයෙදේ නම් කම්කරු ශ්‍රමය, මීහරක් හා ට්‍රැක්ටර් ලබාගැනීමේදී ඇතිවන දුෂ්කරතා මගහැරේ. මීට අමතරව යම් ස්ථානයක වගාව පාලු වී නම් ඊළඟ කන්නය එනතුරු බලා නොසිට පාලුවූ ස්ථානයේ නැවත වගා කිරීම ද කළ හැක.

ඉහත සඳහන් වාසි අත්වුනත්, වගා කාලසටහන අනුව ක්‍රියා නොකිරීමෙන් අපේ ප්‍රධාන ඉලක්කයන් දෙකක්වන අස්වැන්න වැඩි කරගැනීම හා ජලය අපතේ නොඇරීම සපුරාගත නොහැක.

අප පෙර සඳහන් කළ පරිදි නියමිත දිනයන්හි වැඩකටයුතු නොකිරීමෙන් අස්වැන්න අඩුවන ආකාරය සලකා බලමු.

නියමිත දිනයන්හි වගා නොකළහොත් ඉතාමත්ම සුදුසු උෂ්ණත්වය, සූර්ය රශ්මිය, ආර්ද්‍රතාවය, තෙතමනය වැනි සාධක නියමිත කාල පරිච්ඡේදයේදී ශාඛයට නොලැබීම නිසා ඒවායේ වර්ධනය හීන වේ.

එමගින් අවසානයේ අස්වැන්න ද අඩුවේ. තවත් කරුණක් නම් සෑම කුඹුරකම වී වැපිරීම හා ගොයම් කැපීම නියමිත දිනයන්හිදී සිදුකෙරේ නම් තනි කුඹුරකට කුරුල්ලන්ගෙන් වන හානියට වඩා සෑම කුඹුරකම ස්වල්ප වශයෙන් සිදුවන හානිය එතරම් විශාල ලෙස ගොවීන්ට බලනොපායි. මේ හැර තනි කුඹුරක අනිත් කුඹුරුවලට පෙර අස්වැන්න නෙලා ඇත්නම් එහි හරකුන් නිදැල්ලේ හැසිරීම නිසා අනික් කුඹුරුවල වගාවන් ද පාලුවිය හැක. මෙම ප්‍රශ්නය එම කුඹුර වටා වැටක් බැඳීමෙන් වුවද විසඳාගත නොහැක්කේ, මේ සඳහා තනි ගොවියෙකුට විශාල වියදමක් දැරීමට සිදුවන නිසයි. එකම යායේ එක් එක් වර්ධක අවස්ථාවල ගොයම් ගස් ඇති කුඹුරු තිබීමෙන්, කෘමීන්ට එක් කුඹුරක සිට එම වර්ධක අවස්ථාවට පත්වෙන ඊළඟ කුඹුරට ලෙහෙසියෙන් මාරුවිය හැක. මෙයට හේතුව එක් එක් වර්ධක අවස්ථාවලදී පමණක් වගාව විනාශ කරන කෘමීන් එම වර්ධක අවස්ථාවේ ඇති අනික් ගොයමට හානි පැමිණවීමයි.

යම් ගොවියෙකු වගා කාලසටහනේ නියමිත දිනය පසුවී තම කුඹුරෙහි බිම් සකස්කිරීම සඳහා හරකුන් හෝ ට්‍රැක්ටර් යොදා ගැනීමේදී එම කුඹුර අවට ඇති යායේ අනික් කුඹුරුවල ඇලවේලි නියර ආදිය කැඩී යාමද, වගාවන් පාලු වීම ද සිදුවිය හැක.

ජලපාලනයේ හා කෘෂි ව්‍යාප්ති සේවයේ යෙදී සිටින නිලධාරීන්ට ද මෙමගින් දුෂ්කරතාවලට මුහුණ පෑමට සිදුවේ. උදහරණයක් ලෙස එක් ගොවියෙක් හෝ ගොවීන් කිහිපදෙනෙක් අනිත් ගොවීන් සමඟ එකම වගා කටයුත්තක නියැලී නොමැති නම්, කෘෂි ව්‍යාප්ති සේවක නිලධාරියාට නියමිත කාර්යන්හිදී දීමට ඇති උපදෙස් මාලාව ගොවීන්ට දීමට ඉතාම අපහසු වේ.

වගා කාලසටහනකට වගා කරන විට ස්වභාවික විපතක් සිදු වුවද එහි පාඩුව සියළුදෙනාටම සිදුවේ. එහි වගකීම කාලසටහන සකස් කිරීමට දායක වූ නිලධාරී මහතුන්ටද හිමිවෙයි. වන්දියක්, රක්ෂණයක් ලබාගන්නා විටක දී එය පහසුවෙන් කිරීමට පුලුවන. හේතුව 'ප්‍රශ්නය' හෝ 'අලාභය' 'පොදු' එකකි. ඒ නිසාම එය වඩා පහසුවෙන් විසඳාගැනීමට ද ඒ සඳහා නිලධාරින්ගේ සහාය ලබාගැනීමට ද පුලුවන.

මේ සියළු කරුණු හැරුණුවිට වාරිමාර්ග පද්ධතියක් යටතේ වගා කෙරෙන කුඹුරක මෙසේ නියමිත දිනයන්වල වගාකටයුතු නොකිරීමෙන් සැලකිය යුතු ජලය ප්‍රමාණයක් අපතේ යැවේ.

අවසාන වශයෙන් කිවයුතුව ඇත්තේ වගා කාල සටහන අනුව වගා කටයුතු කිරීම බොහෝවිට ඔබට පමණක් නොව යායේ අනෙක් ගොවීන්ට ද යහපතක් සිදුවන බවය. එයින් අවසානයේ මුළු රටටම යහපතක්ම සිදුවනවා පමණක් නොව, එය කෘෂි කාර්මික සංවර්ධනයෙහිලා ඉටුවන තවත් සේවයක්ද වේ.